# ලංකා බැංකුව

විදේශ රටවල සහ දිවයින පුරා දිවෙන පුළුල් ශාඛා ජාලයක් සහිත ලොව ප්‍රමුඛපෙළේ බැංකු 1000 අතරට ශ්‍රේණිගත කර ඇති එකම ශ්‍රී ලාංකික බැංකුව මෙන්ම ලංකාවේ අංක 01 බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුර සඳහා පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති පළපුරුදු පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්මික ශිල්පී (විදුලි කාර්මික)

### යෝග්‍යතා නිර්ණායක

➢ ශ්‍රී ලාංකිය පුරවැසියකු විය යුතුය.

➢ සුදුසුකම් සහ පළපුරුද්ද

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන 08 වන ශ්‍රේණි විභාගය සමත් වී තිබීම.

**සහ**

- පිළිගත් ආයතනයක විදුලිය සහ වායු සමීකරණය පිළිබඳ මාස හයක (06) පූර්ණ කාලීන හෝ වසරක (01) අර්ධකාලීන පාඨමාලාවක් හදාරා තිබීම.

**සහ**

- ගොඩනැගිලි වයරිං කිරීම පිළිබඳ අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද

➢ **වෙනත් සුදුසුකම්**

- අවම අධීක්ෂණය යටතේ සේවය කිරීමේ හැකියාව.
- කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස සේවය කිරීමේ හැකියාව.
- ස්වයං අභිප්‍රේරිත බව සහ බැංකුවේ අරමුණු සාර්ථක කරගැනීමට කැපවීමේ හැකියාව.

➢ **වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 හෝ ඊට අඩු විය යුතුය.

### පොදු නියමයන් හා කොන්දේසි

➢ මෙම තනතුර බැංකු සේවයෙහි සාමාන්‍ය නියමයන් හා කොන්දේසි වලට යටත් වන නමුත් සාමාන්‍ය බැංකු සේවයට පරිබාහිර (සංවෘත සේවය) වේ.

➢ පරිවාස කාල සීමාවේ බැංකුව සෑහීමට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලීමෙන් පසු සුදුසු බව පෙනී ගියහොත්, වසර දෙකක(02) පරිවාස කාලයකින් පසු කාර්මික ශිල්පී -I ලෙස බැංකු සේවයේ ස්ථිර කරනු ලැබේ.

➢ තනතුරට අදාළ වැටුප් පරිමාණය:

රු. 36,565/- රු. 41,765/-

රු. 260/- X 20

(විචල්‍ය ජීවන වියදම් දීමනාව සමග සියල්ල ඇතුලත් ආසන්න ආරම්භක දළ වැටුප මසකට රු. 120,000/= පමණ වේ.)

➢ කාර්යාල වේලාවෙන් පසුව, සති අන්ත/නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

➢ බැංකුවේ අවශ්‍යතාව අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

### තෝරා ගැනීමේ පටිපාටිය

ඉහත දැක්වූ යෝග්‍යතා නිර්ණායකයන්ට අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

### අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk තුලින් ("Careers" තීරය හරහා) ලබාගත හැකි ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සැකසූ ඔබගේ අයදුම්පත, නියමිත අවශ්‍යතා සපුරන සියලු සහතිකපත්වල සහ ඔබේ රැකියා පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය ලේඛන යනාදියෙහි ඡායාස්ථ පිටපත් සමග ඔබගේ තොරතුරු ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ සම්බන්ධ කරගැනීමේ විස්තර ද ඇතුලත් 2024 මැයි මස 18 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු අතර, අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඔබ අයදුම් කළ තනතුර ද සඳහන් කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරානොමැති හෝ අදාළ සනාථකිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත්කරන හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව එවන ඕනෑම අයදුම්පතක් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවාගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ප්‍රධාන කළමනාකරු (බඳවාගැනීම් හා වෘත්තීය සංවර්ධන)**
**ලංකා බැංකුව,**
**26 වන මහල - ප්‍රධාන කාර්යාලය,**
**ලංකා බැංකු චතුරශ්‍රය,**
**අංක 1, ලංකා බැංකු මාවත,**
**කොළඹ 01.**

■ බැංකුව වෙත කිසිම ආකාරයක බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසුභාවයට පත්කිරීමට හේතු වේ.

■ තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.

■ සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවා ගැනීම කල් දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

■ බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.


1975 BOC CALL CENTRE
www.boc.lk
A (lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA Brand Finance ශ්‍රේණිගත කිරීම,
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.



ප්‍රධාන කාර්යාලය, BOC චතුරශ්‍රය,
අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.



ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ